# ජාතික මහජන සභාව

ශ්‍රී ජේතවනාරාමය, දූනගහ, ඉදුරාගාර.

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී කණ්ඩායම,
නිදහස ජාතික සභාව

ගරු මැතිතුමනි,

## 2022.09.27 දින 61 වැදෑරුම් උපායමාර්ගික වැඩපිළිවෙලට අදාල සාකච්ඡාව තුළින් මතු වූ අදහස් පිළිබඳව වැඩිදුරටත් කරුණු පැහැදිලි කිරීම

වත්මන් ආර්ථික අර්බුදය විසඳීම සඳහා ජාතික සංවිධාන ලෙස අප විසින් සමාජගත කළ උපාය මාර්ගික වැඩපිළිවෙළ පිළිබඳව ඔබතුමා ප්‍රමුඛ නිදහස ජාතික සභාවේ නියෝජිතයන් සමග සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව පළමුවෙන්ම කෘතඥ වෙමි. එම සාකච්ඡාව ඉතා ඵලදායී සාකච්ඡාවක් වූ බවද ඉතා සතුටින් දන්වා සිටිමි

එම සාකච්ඡාවේ දී මතු වූ කරුණු අනුව ඉන්දියාව සමග ගනුදෙනු කිරීමේදී නව ප්‍රවේශයක් අවශ්‍ය බවට සහ ඒ පිළිබඳව අපගේ මතය කුමක්දැයි විමසීමක් සිදුවිය. එසේම රටේ පවතින අර්බුදය ආර්ථික අර්බුදයක් නොවන බවට සහ එය හුදු මූල්‍ය අර්බුදයක් බවට පවතින මතය පිළිබඳව ද කරුණු විමසීමක් සිදුවිය. එහිදී අප විසින් මූලික පැහැදිලි කිරීමක් සිදු කළ ද කාලවේලා ගැටලුව නිසා ඒ පිලිබද අපගේ අදහස් ඉදිරි කාලයේදී ඉදිරිපත් කරන බව අප විසින් දන්වා සිටින ලදී. ඒ අනුව පහත සඳහන් කරුණු අවධාරණය කිරීමට කැමැත්තෙමු.

1. ඉන්දියාව සමඟ ගනුදෙනු කිරීමේදී පමණක් නොව ඇමරිකාව සහ චීනය සමඟ ගනුදෙනු කිරීමේදී ද අපගේ නව ප්‍රතිපත්තිය විය යුත්තේ 1970 දී අනුගමනය කළ ප්‍රතිපත්තියම බව අපි විශ්වාස කරමු. එනම් නොබැදි ප්‍රතිපත්තියට අනුව කටයුතු කිරීමයි. එහෙත් ''නොබැදි'' වචනය අර්ථ දැක්වීමේදී ''මධ්‍යස්ථ'' යන්න යොදා ගැනීම වරදක් බව ද සඳහන් කළ යුතුය. පාත්ෆයින්ඩර් වැනි සංවිධාන විසින් නොබැදි ප්‍රතිපත්තිය යනු මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් බවට පළ කරනු ලබන අදහස් අපි අනුමත නොකරමු. මධ්‍යස්ථ යනු මැද සිට ගැනීමේ දියාරු ප්‍රතිපත්තියකි. එහෙත් නොබැදි ප්‍රතිපත්තිය යනු ඊට අදාළ මූලධර්ම වලට ගරු කරන රටවල් සමග බැඳෙන ප්‍රතිපත්තියකි

2. ඒ අනුව ශ්‍රී ලංකාව 1971 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කළ 2832 යෝජනාව හෙවත් ඉන්දියානු සාගරය සාම කලාපයක් බවට පත් කිරීමේ යෝජනාව අනුව එහි සඳහන් ආකාරයට කටයුතු කළ යුතු අතර එය බලාත්මක කිරීම සඳහා ගොඩනගාගත් ඉන්දියානු සාඟර වළල්ල සංවිධානය (IORA) තුළ ප්‍රබල භූමිකාවක් ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතුය.

3. එම යෝජනාවට අනුව ආරක්ෂක ගිවිසුම් අත්සන් කිරීම සඳහා කිසිදු මහා බලවතෙකු විසින් අප රටට බලපෑම් නොකළ යුතුය. ආර්ථික වශයෙන් හෝ ආයෝජන සඳහා මිත්‍ර පාර්ශව වලින් උදව් ලබා ගැනීමේදී එය වැළැක්වීම සඳහා බලපෑම් එල්ල නොකළ යුතුය. එම තීන්දු ගැනීමේ ස්වාධීනත්වය අප සතු විය යුතුය.

4. ඉන්දියාව තම භූ දේශපාලන උවමනාවන් සඳහා ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල කිරීමේදී ඊට මුහුණ දීම සඳහා හෙවත් ගැලවීමේ උපක්‍රමයක් ලෙස ව්‍යවස්ථාගත ප්‍රතිපත්තිමය පදනමක් සහ ඒ මගින් දිරිමත් කෙරෙන මහජන මතය හෙවත් විරෝධය යොදාගත යුතුය. ඊට අදාලව ව්‍යවස්ථාගත කළ යුතු ප්‍රතිපත්තිමය පදනම විය යුත්තේ භෞමික අඛණ්ඩතාවයට හානිදායක නොවීම සහ දේශීය නිෂ්පාදන පද්ධතියට අගතිගාමී නොවීම උපාය මාර්ගික මර්මස්ථාන අන්සතු නොකිරීම මෙන්ම ජාතික ආරක්ෂාවට අනතුරුදායක නොවීම ආදියයි.

5. ඊට අමතරව රටක් සමඟ අප රටේ කර්මාන්ත පද්ධතියට සහ කෘෂිකර්මාන්තයට හානිදායක වන වෙළඳ හෝ හෝ ආයෝජන ගිවිසුම් අත්සන් නොකළ යුතුය. එහිදී මූලික පදනම විය යුත්තේ වෙළඳාම ප්‍රචලිත කිරීම නොව ආරක්ෂණවාදය හෙවත් දේශීය ආර්ථිකය ආරක්ෂා කර ගැනීමය.

6. වෙළඳ හෝ ආයෝජන හෝ ආර්ථික ගිවිසුම් පිළිබඳව විදේශීය පාර්ශව සමග සාකච්ඡා කිරීමේ දී සහ එකඟතාවයන් ඇති කර ගැනීමේදී මහජන වගවීම සහ විනිවිදභාවය සහතික කිරීම මෙන්ම එම ගිවිසුම් මගින් රටේ ආර්ථිකයට, පරිසරයට හෝ සංස්කෘතියට හානියක් සිදු නොවන බව සහතික කිරීම සඳහා නව නීතිමය රාමුවක් හඳුන්වා දිය යුතුය. එම නීතියට අනුව අදාළ සාකච්ඡා වලට සහභාගී වන පුද්ගලයින්ගේ නම් හෙළිදරව් කළ යුතු අතර ගිවිසුම අත්සන් කිරීමට පෙර එය පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර ඡන්දයෙන් අනුමත විය යුතුය.

7. ඉන්දියාව, ඇමෙරිකාව, ජපානය, ඕස්ට්‍රේලියාව යන රටවල් 4 විසින් දියත් කරන ඉන්දු පැසිෆික් න්‍යාය පත්‍රයට ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවෙකු කර ගැනීම ඔවුන්ගේ අපේක්ෂාව වන බැවින් නොබැඳි ප්‍රතිපත්තියට අනුව ඊට ගොදුරු නොවී බලවත්ව සිට ගැනීම වැදගත් වේ. (එම උපාය මාර්ගයට අනුව ශ්‍රී ලංකාව එම න්‍යායපත්‍රයේ පාර්ශ්වකරුවෙකු කර ගැනීමට ඔවුන් අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රී ලංකාව ඉන්දියාවේ අර්ධ යටත්විජිතයක් ලෙසය) ඒ සඳහා වාණිජ ගිවිසුම් මගින් චීන ආයෝජන දිරිගැන්වීම හරහා මුහුණ දීමේ හැකියාව හෙවත් ආර්ථික ශක්තිය වර්ධනය කරගත යුතුය. චීන ආයෝජන සමඟ සෘජුව හූ දේශපාලන නූල් යට ගැසී නොමැති බැවින් නොබැඳි ප්‍රතිපත්තය යටතේම ඒ සඳහා විශාල ඉඩක් නිර්මාණය කිරීමේ හැකියාව ඇත.

8. ආර්ථික අර්බුදයට මුල් වූ සැබෑ හේතුව යටපත් කර වෙනත් අතුරු හෝ අවශේෂ හේතු ඉදිරිපත් කිරීම මේ දිනවල බහුලව දක්නට ඇත. එහි අරමුණ මෙම අර්බුදය ආශිර්වාදයක් බවට පත් කරගනිමින් අප රටේ ආර්ථික මොඩලය පදනමෙන්ම වෙනස් කිරීම වැළැක්වීම යයි අපි සිතමු. ඒ නිසා හොරකම නිසා අර්බුදය ඇති වූ බවට සහ ආර්ථික අර්බුදයට හේතු වූ හේතුව මූල්‍ය අර්බුදය හෝ වත්මන් අර්බුදය ආර්ථික අර්බුදයක් නොව මූල්‍ය අර්බුදයක් ඇයි පළ කරනු ලබන මතවාද අපි ප්‍රතික්ෂේප කරමු. එම අතුරු කරුණු වලට අවධානය යොමු කිරීමට පෙර මෙම අර්බුදයට මූලික හේතුව 1977 සිට පවත්වා ගෙන එනු ලැබූ වෙළඳාම සහ ණය මත පදනම් වූ නාගරික ඉදිකිරීම් මගින් ආර්ථික වර්ධනය හුවා දක්වන පරාධීන ආර්ථික මොඩලය බව අප පිළිගත යුතුය. හොරකම, දූෂණය, අකාර්යක්ෂමතාවය එම මොඩලයේ සංජානීය ලක්ෂණයකි.

ස්තූතියි,
මෙයට
විශ්වාසී

මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
ජාතික මහජන සභාව
2022.09.29
0777 555 517